# බීජ වැපිරීමේ සිට අස්වනු නෙලා ගැනීම දක්වා සම්ප්‍රදයික ගොවීන් අනුගමනය කළ සිරිත්

*ආනන්ද සමරකෝන්*
පර්යේෂණ සහ පුහුණු කිරීමේ නිලධාරී
ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය

**අග්නිදිග ආසියාතික රටවල ප්‍රධාන ආහාර බෝගය ලෙස වී වගාවට හිමිවන්නේ සුවිශේෂ වූ ස්ථානයකි. ශ්‍රී ලංකාවේ ද ප්‍රධාන ආහාර බෝග්‍ය වශයෙන් සැලකෙන වී වගාවේ ඉතිහාසය, කුමන අවධියකට අයත් දැයි අපැහැදිලි ය. කෙසේ වෙතත් විජයගේ පැමිණීමට පෙර ද, මෙරට වී වගා කළ බවට ඉතිහාසගත සාක්ෂි ඇත.**

මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන සිය පැවැත්ම උදෙසා ආහාර සපයා ගැනීමට වී ගොවිතැන කෙරෙහි ආදී මිනිසා යොමු විය. මෙහි දී සෑම කටයුත්තක්ම කෙරුනේ ඔහු දිවි ගෙවූ පරිසරය හා සහජීවනයෙන් ඊට හානි නොවන පරද්දෙනි. මෙය ශ්‍රී ලංකාවට පමණක්ම ආවේණික වූ තත්ත්වයක් නොවූ අතර බොහෝ ආසියාතික රටවල දක්නට තිබූ මූලික ලක්ෂණයකි. එසේම මෙය මිනිසාගේ සංස්කෘතික සබැදියාවට සහ සංවර්ධනයට ද මං සලසන ලදී. ඓතිහාසික සහ මුඛ පරම්පරාගත තොරතුරු වලට අනුව පෙර දවස මෙරට කෘෂිකාර්මික සමාජය ස්වයංපෝෂිත මට්ටමක පැවතී ඇත. ගොවිතැන ආශ්‍රිතව අතීතයේ බිහි වූ කමත් කවි, ගොයම් කවි සහ නෙළුම් කවි ආදී ජන කවි තුලින් වුව ද හෙලිවන්නේ අතීත ගොවියාගේ සැබෑ දිවි පෙවතයි. මෙ මගින් අතීත ගොවි සමාජයේ පැවතියා වූ සංස්කෘතිකාංග පිළිබඳව වුව ද වැටහීමක් ලබා ගත හැකි ය.

යටත් විජිත යුගයෙන් පසු කාලපරිච්ඡේදය තුළ ඇති වූ විපර්යාසයන් පාදක කොට ගෙන සාම්ප්‍රදයික කෘෂි තාක්ෂණය මෙන් ම කෘෂි සමාජය ද නොයෙකුත් වෙනස්කම්වලට බඳුන් විය. යටත් විජිත යුගයේ ප්‍රතිඵලයක් ලෙස පාරම්පරික බෝග වගා වෙනුවට වාණිජ බෝග හඳුන්වා දෙනු ලැබිනි. මේ සඳහා හරිත විප්ලවයේ බලපෑමද නොමඳව පැවති අතර හරිත විප්ලවයේ මූලික අරමුණ වූයේ සාම්ප්‍රදයික ලක්ෂණ පිළිබිඹු කළ කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමයි. මෙම නවීකරණය කිරීමේ අවශ්‍යතාවය පැන නැඟීම සඳහා කරුණු කිහිපයක් බලපාන ලදී. මූලික වශයෙන් ජනගහණය වැඩිවීමත්, ඒ හා සමානව භූමි ප්‍රමාණයේ වැඩිවීමක් දක්නට නොලැබීම තුළ උපරිම අස්වැන්නක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වූවක් විය. මෙම තත්ත්වය තුළ සාම්ප්‍රදයික කෘෂි කර්මාන්තය නවීකරණයට ලක්විය. එහි ප්‍රතිඵලය වූයේ සාම්ප්‍රදයික කෘෂි කර්මාන්තය ක්‍රමයෙන් අභාවයට යාම සහ හර වටිනාකම් පද්ධතිය වෙනසකට භාජනය වීමය.

සාම්ප්‍රදයික කෘෂි කර්මාන්තයේ වී ගොවිතැන ආශ්‍රිතව පැවතියා වූ සිරිත්, විරිත් පිළිබඳව විමසා ලැබීම වැදගත් වනු ඇත. මෙම ලිපියෙහි මූලික අරමුණ වන්නේ ද වී වගාව ආශ්‍රිතව බීජ සකස් කර ගැනීමේ සිට අස්වනු නෙලා ගැනීම දක්වා වූ විවිධ අවස්ථාවන් හි දී ගොවීන් විසින් අනුගමනය කළ පුද සිරිත් හා කෙටි ක්‍රම සම්බන්ධ කෙටි විමසීමක යෙදීමය.

සාම්ප්‍රදයික කෘෂිකාර්මික සමාජය තුළ කෘෂිකර්මයට හිමි වූයේ අද්විතීය ස්ථානයකි. ජනගහනයෙන් වැඩිපිරිසක් වී ගොවිතැන තම ප්‍රධාන ජීවනෝපාය ලෙස තෝරා ගනු ලැබීය. පැරැන්නන් තුළ දිගු කාලයක් තුළ කෘෂිකර්මයේ නියැලීමෙන් ලත් අත්දැකීම් වී ගොවිතැනෙහි සශ්‍රික භාවයට හේතු කාරක විය. නමුත් විදේශීය තාක්ෂණික දැනුම මෙරටට ගලා ඒමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය චින්තනයෙන් ඔප් නැංවුනු සාම්ප්‍රදයික තාක්ෂණය කෙමෙන් අභාවයට පත්ව යන්නට විය. අද අපට දක්නට ඇත්තේ විදේශීය තාක්ෂණය මත රඳා පවත්නා ස්වරූපයකි. මෙයින් අදහස් වන්නේ නූතන විද්‍යාවේ දැනුම ප්‍රතික්ෂේප කිරීමක් නොව මෙරට පැවති විද්‍යාත්මක දැනුමත් සමග අත්‍යාවශ්‍ය තාක්ෂණික අංග මෙරටට අව්‍ය පරිදි සකස් කර ගැනීම හා සම්බන්ධ වූවකි

හරිත විප්ලවයේ බලපෑමට හසු වීමට පෙර මෙරට කෘෂිකර්මාන්තය තුළ හීනටි, මුතු සම්බා, දෙවරැද්දිරි, මාතික්කම්, මල්වාරන්, සුදු මාතික්කන්, රතු මාතික්කන් ඇතුළු වී ප්‍රභේද දහස් ගණනක් පැවති බවට සාක්ෂි ඇත. එසේම බීජ හා සම්බන්ධිත පර්යේෂණාගාර ද තිබිණි. නමුත් වර්තමානය තුළ දැකිය හැකි වන්නේ දහස් ගණනක් වූ ප්‍රභේද වලින් ඉතිරිව ඇති ඉතා සුළු ප්‍රමාණයකි. ඒ සඳහා යටත්විජිත පාලනයත්, හරිත විප්ලවයේ බලපෑමත් සෘජුවම බලපා ඇත. හරිත විප්ලවය තුළින් හඳුන්වා දෙන ලද නව අභිජනනය කරන ලද වී වර්ග කෘෂි සමාජයට පිවිසීමත් සමග එතෙක් තිබුණුවී ප්‍රභේද අභවයට යාම ඇරඹී ඇත. මෙහි දි නව බීජවල දක්නට ලැබුණු ලක්ෂණ වන්නේ කෙටි කාලීනව අස්වනු ලබා ගත හැකි බව, ආර්ථික වශයෙන් ඵලදායී බව එනම් වැඩි අස්වැන්නක් ලබාදීම, ව්‍යාපාරික වශයෙන් වාසි සහගත බව යනාදියයි. එසේම සාම්ප්‍රදයික වී ප්‍රභේද සංරක්ෂණය කර වැඩි අස්වැන්නක් ලබාගත හැකි පරිදි සකස් කර ගනු වෙනුවට ලාභ ලැබීම ප්‍රධාන පරමාර්ථය කර ගැනීම මෙම තත්ත්වයට ප්‍රධාන වූ හේතු සාධක වී ඇත.

සාම්ප්‍රදයික කෘෂිකාර්මික අර්ථ ක්‍රමය තුළ බීජ සකස් කිරීම, බිම් සකස් කිරීම සිට අස්වනු නෙලා ගැනීම දක්වා සෑම අවස්ථාවක දීම මුතුන් මිත්තන් කටයුතු කරනු ලැබුවේ ආගමානුකූල සිරිත් විරිත් වලට අනුවයි. එය බොහෝ විට දෙවියන්ගේ හා බුදුන්ගේ ආශිර්වාදය මැද සිදුකරනු ලැබිණි. ඉතිහාසය දෙස බලන විට පෙර රජ දවස පවා වප් මගුල් උත්සව සුභ නැකත් වේලාවන්ගෙන් ආරම්භ කර වී අස්වනු නෙලීමෙන් පසු අළුත් සහල් මංගල්‍යය කටයුතු ආදිය පැවැත්වීමෙන් අනතුරුව නිමාවට පත් කරනු ලැබීය. වර්තමානයේ ද එම උත්සව කටයුතු සංස්කෘතික අංගයක් ලෙස වසරක් පාසා කරනු ලැබීම ඇතැම් ප්‍රදේශ වල දැකිය හැකි ලක්ෂණයකි.

20 පිටුවට ➪

19 පිටුවෙන්

## බීජ වැපිරීමේ සිට.....

වර්ෂාව ලැබෙන ආකාරය මත මෙරට යල - මහ වශයෙන් කන්න දෙකකි. ඒ අනුව මහ කන්නය වඩාත් හොඳින් වර්ෂාව ලැබෙන කන්නයක් වන බැවින් වී වගාව සඳහා ඔවුන් වැඩිමල් වී යොදගනු ලැබූහ. යල් කන්නය සඳහා බාලවී යොද ගනු ලැබිණි. සාම්ප්‍රදයික කෘෂි සමාජය තුල ගොවීන් වී වගාවේදී භාවිතා කරනු ලැබුවේ මෙරට නිෂ්පාදිත වී ප්‍රභේදයන් ය. එම බීජ බොහෝ විට ඔවුන් විසින් ම නිෂ්පාදනය කර ගනු ලැබූ ඒවා විය. ගොවීහූ තම අස්වනු නෙලීමෙන් පසු තම බීජ අවශ්‍යතා සඳහා අස්වනු වලින් කොටසක් ගබඩා කර තබනු ලැබූහ. එම බීජ බිත්තර වී යනුවෙන් හැඳින්විනි.

සාමූහිකත්වය පදනම් කර ගත් ක්‍රියාවලියකට අනුකූල ගොවීන් හා ගොවිතැන් කටයුතු කරනු ලැබීම මුල් කාලයේ දක්නට ලැබෙන විශේෂ ලක්‍ෂණයකි. වගා කන්න සඳහා අවශ්‍ය සුදුසු වී වර්ගය තෝරා ගැනීම ද එකම කාල පරිච්ඡේදයන් තුළ වගා කටයුතු ආරම්භ කිරීම වැනි කාර්යයන් තුලින් ඔවුන්ගේ සාමූහික බව නිරූපනය විය. තම වගාවන් වලට වන හානිය එනම් කෘෂි සතුන්ගෙන් වන උවදුරු හා වෙනත් ස්වාභාවික උවදුරු වලින් තම වගාවන් ආරක්‍ෂා වීම සඳහා එය වඩාත් උපකාරී විය. එහිදී ඔවුන් වගා කටයුතු ආරම්භ කරනු ලැබුවේ නැකැත් වේලාවකට අනුකූලවයි. එසේම ප්‍රදේශ භාර දෙවියන්ට හා වෙනත් දෙවි දේවතාවන්ට භාර වීම් සිදු කරනු ලැබීමෙන් ද අන්තුරුවයි. එය අද පවා සමහර ප්‍රදේශවල දැකිය හැකි ලක්‍ෂණයකි. මෙසේ වගා කිරීමෙන් අනතුරුව තම කුඹුරු ආරක්‍ෂා කර දීම සම්බන්ධයෙන් අදාල දෙවියනට පුද පූජා පැවැත්වීම, ගම්මඩු දීම මෙන්ම අළුත් සහල් මංගල්‍යය වැනි ආගමික කටයුතු වලින් තම ගොවි බිමේ කටයුතු අවසන් කරණු ලැබීම වර්තමානයේ දී ද සමහර ප්‍රදේශවල දැකිය හැකි ලක්‍ෂණයකි.

ගොවීන් තම බීජ අවශ්‍යතා සපුරා ගැනීමේ දී ද ඔවුන් තුල දක්නට ලැබුනේ සාමූහිකත්වය පදනම් කර ගත් ක්‍රියාවලියකි. ඔවුන් තම වගාවට අවශ්‍ය බීජ ලබා ගනු ලැබුවේ අසල්වැසියන්, ඥාතීන් හා මිත්‍රයන්ගෙනි. එය බොහෝ විට සිදු කරනු ලැබුවේ සාමූහිකත්වය පදනම් කර ගත් හුවමාරු පදනම යටතේ ය. එමගින් ඔවුනට අවශ්‍ය බීජ ලබා ගැනීමේ අවශ්‍යතාවයන් සපුරා ගන්නා අතරම සමාජ සම්බන්ධතාවයන් ද ගොඩ නගා ගන්නා ලදී. එය සාම්ප්‍රදයික කෘෂිකර්මාන්තයේ දැකිය හැකි උසස් ගුණාංගයක් ලෙස පෙන්වා දිය හැක.

අස්වනු නෙලා ගැනීමෙන් අනතුරුව ඔවුන් තම බීජ අවශ්‍යතා සඳහා ගනු ලැබූ වී තම අසල්වැසියෙකු විසින් ලබා ගන්නා විට ඒ සඳහා හිලව් වශයෙන් වැඩි වී ප්‍රමාණයක් දෙනු ලබයි. එය බොහෝ විට අස්වනු නෙලීමෙන් අනතුරුව වී මනින අවස්ථාවේ ම වෙන් කරනු ලැබීම අද පවා දැකිය හැකිය. එසේ වුව ද අතීතයේ දක්නට ලැබුනේ බිත්තර වී සඳහා ලබා ගත් ප්‍රමාණයම ආපසු ලබා දීමේ පිළිවෙතකි.

සාම්ප්‍රදයික කෘෂිකාර්මික සමාජය තුළ වී ප්‍රභේද විශාල ප්‍රමාණයක් තිබුණු බව අපි දනිමු. මෙම වී වර්ග වර්තමානය හා සසඳන කල අඩු අස්වැන්නක් ලබා දුන්න ද මෙම වී වර්ග වලට වැළඳෙන රෝග කාරක තත්ත්වයන් අඩු ය. මන්ද ඔවුන් පරිසරයට අනුකූලව වගා කළ බැවිනි. අද මෙන් කෘත්‍රිම පොහොර කෘෂි රසායනික භාවිතයක් එද දක්නට ලැබුනේ නැත. එසේ වුව ද ඔවුන් ගොවිබිම සාරවත් කිරීම සඳහා වෙනත් ක්‍රම උපයෝගී කර ගනු ලැබීය. ඔවුන් සාරවත් බව රැකීම සඳහා ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගනු ලැබීය. උදා: ලෙස අස්වනු නෙලා ගැනීමෙන් පසු ඉවත්වන පිදුරු කුඹුරු වලට දැමීම හා ඒවා පිළිස්සීම, වෙනත් ශාක වර්ග යොද ගැනීම, අස්වනු නෙලීමෙන් අනතුරුව ගවයින් කුඹුරු වල දිගෙලි කිරීම (ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා යෙදවීම) ආදිය දැක්විය හැකි ය. මෙහි දී ගවයින්ගේ මලමූත්‍ර කුඹුරු වලට එක්වීමෙන් පසේ සාරවත් බව වැඩි කිරීම, මියගිය ගවයින්ගේ ඇටකටු දිරාපත් වූ විට කුඩා කොටස් වලට කැබැලි කර කුඹුරට ඉසීම වැනි දෑ මගින් කුඹුරේ සාරවත් බව සඳහා වැඩිදුරටත් කටයුතු කිරීම් දක්නට ලැබිණි. එය වැඩි පලදාවක් මෙන්ම හොඳ බීජ ලබා ගැනීම සඳහා උපකාර විණි. එසේම පසේ සාරවත් බව ලබා ගැනීම සඳහා දෙවියන්ගේ ද ආශිර්වාදය ලබා ගැනීම එද දක්නට ලැබුණු ලක්‍ෂණයකි.

මේ පාරම්පරික ගොවි ජනතාව තම ගොවිබිම් කෘෂි සතුන්ගෙන් හා වෙනත් රෝග වලින් ආරක්‍ෂා කර ගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කරන ලදී. දිගු කාලීනව ලබා ගත් දැනුම් සම්භාරයට අනුකූලව ඔවුන් එකම වී වර්ගය එකම කාල පරිච්ඡේදයකට වගා කිරීම තුළ තම වගාවන් මෙම රෝග කාරක තත්ත්වයෙන් මුදවා ගැනීමට උනන්දු විය. වී වගාවට හානි කරන මැස්සන්ගෙන් කුඹුරු අරක්‍ෂා කිරීම සඳහා ඔවුන් විවිධ ක්‍රම අනුගමනය කරණ ලදී. එම උපක්‍රමයන් ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් ස්වරූපයක් ගනු ලැබීය. උදා: මී තෙල් වලින් පහන් පත්තු කිරීම, මී තෙල් හා කොහොඹ තෙල් ගැල්වූ පටියක් වී කරලේ ගෑවෙන පරිදි කුඹුරේ ඉහළ හා පහලට ඇදීම වැනි කටයුතු කරනු ලැබීය. මෙයට අමතරව ඔවුන් විසින් දෙවියන්ට භාර වීම ද කෙම් ක්‍රම යොද ගැනීම, මන්ත්‍ර ජප කිරීම වැනි කටයුතු ද කරනු ලැබීය. මීයන්ගෙන් කුඹුරු අරක්‍ෂා කර ගැනීම සඳහා ඔවුන් ශාන්තිකර්ම ප්‍රයෝජනයට ගැනීම ද උදහරණයක් සේ දැක්විය හැකිය. එවැනි අවස්ථාවක පස්මල් සහිත තට්ටුවක් ද පහනක් දල්වා නූලක ගැට හතක් ගසා නූල ජීවම් කිරීම වැනි කටයුතු කරනු ලැබීය. එසේම සිවුරු කඩවලින් පහන් පත්තු කිරීම ද කරනු ලැබීය. එයින් නිරූපනය වූයේ බුදුන්ගේ මෙන්ම දෙවියන්ගේ ආශිර්වාදයයි.

වගාව සඳහා බිම් සකස් කිරීමෙන් අනතුරුව බීජ තවාන් දැමීම සම්බන්ධයෙන් ද ගත් කල ඔවුන් ආරක්ෂිත ක්‍රම අනුගමනය කරන ලදී. වැපිරීම සඳහා ගන්නා බීජ බිත්තර වී වශයෙන් ද එය අවශ්‍ය පරිදි සකස් කර වැපිරීම සඳහා යොද ගන්නා අවස්ථාවේ දී පැල මූල වශයෙන් ද හඳුන්වනු ලබයි. සාම්ප්‍රදයික ක්‍රම අනුගමනය කරන ගොවියා බීජ වැපිරීම සඳහා බීජ සකස් කිරීමේ දී ද විවිධ ක්‍රම අනුගමනය කළහ. එනම් වතුරේ දමා පෙඟවීම ඊට පසු එම බීජ වතුර ඉවත් කොට තැන්පත් කොට පුවක් අතු වලින් වසා මුල් ඇද්දූ විට එලියට ගෙන වැපිරීම වැනි දෑ සුදුසු ලෙස සකස් කරනු ලබයි. තවාන් දැමීම සිදු කළ විට පැල සිටුවීමේදී ගෙවිලියන් අතින් සිදු කිරීම සාමාන්‍ය සිරිත වේ. එහි දී තම වෙහෙස නිවා ගැනීම වස් නෙළුම් කවි කීම එද මෙන් අද ද දැකිය හැකි ලක්‍ෂණයකි. මේ සෑම දෙයකන්ම නිරූපණය වූයේ ගැමි සංස්කෘතිය හා බැඳුනු ජන සාහිත්‍යයයි. මෙහි දී බුදු ගුණ ගැයුම හා දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීම මෙම කවි තුළ ගැබ්ව පැවතිනි.

බීජ කුඹුරු වල ඉසීම "වැපිරීම" යනුවෙන් අදහස් කරනු ලබයි. වැපිරීමේ දී එම කාර්ය සම්බන්ධයෙන් මනා අවබෝධයක් ඇති පිරිස් ගම්වල වාසය කළෝ ය. දැනුදු ඒ පිළිබඳව දක්‍ෂයින් ඇත. වැපිරීම් කටයුතු ආරම්භ වනුයේ දෙවියන් හා බුදුන්ගේ ආශිර්වාදය මැදයි. ප්‍රදේශයේ ගොවීන් විසින් එක් එක් කුඹුරු යායවල් වල බීජ වැපිරීමට මත්තෙන් "බිත්තර වඩනවා" යනුවෙන් කාර්යයක් කරනු ලබයි. එහි දී ගොවියෝ තම කුඹුරේ නියර මත පොල් මලක් ගෙන සිටුවා හබරල පැලයක් ද සිටුවා වී ඇට ස්වල්පයක් ඉසිති. එය කරනු ලබන්නේ යාය තුළ සියලුම ගොවීන් විසින් එකම නැකැත් වේලාවකට ය. මෙ මගින් ඔවුන් අපේක්‍ෂා කරනු ලැබුවේ තම ගොවි බිමෙන් හොඳ අස්වනු ලබා ගැනීම සඳහා වගා කන්නය තුළ ඇති විය හැකි සියළුම උපද්‍රව වලින් අරක්‍ෂාවකි. මෙහි දී එම යාය තුළ එකවිට වගා කටයුතු ආරම්භ කිරීම පිළිබඳවත් වගා කළ යුතු බීජ පිළිබඳවත් දැනුමක් එක් එක්

ගොවියාට ලබා දෙනු ලබයි. ගොවිපලෙහි වැඩ ආරම්භ වනුයේ අනතුරුව යි. මෙය වර්ථමානයේ "කන්න රැස්වීම" ට බොහෝ සෙයින් සමාන ස්වරූපයන් ගනු ලැබිණි.

අස්වනු කැපීමේ දී ද ඔවුන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත් සංස්කෘතික වටිනාකමකින් යුක්ත ය. සිංහළ සිරිතට අනුව ගොයම් කැපිම සඳහා දෙවියන්ගෙන් හා බුදුන්ගෙන් අවසර ගැනීම එනම් වරම් ලබා ගැනීම පළමුවෙන් කරනු ලැබිණ. වර්ථමානයේ ද බොහෝ ප්‍රදේශ වල පළමු ගොයම් අහුර කැපීමේ දී ගොයම් ගසට වැඳීම දක්නට ලැබෙන ලක්ෂණයකි. මුල් කාලීනව ග්‍රාමීය ගොවීහු විසින් ගොයම් කැපීම සඳහා එම ප්‍රදේශයේ සුදුසු පුද්ගලයෙකු තෝරා ගැනීම ද කරනු ලැබූහ. එම තත්ත්වයයන් ගෙන් පිළිබිඹු වනුයේ ගොයම් ගස් සම්බන්ධයෙන් ඔවුන් දැක් වූ භක්තියයි. ගෙවිලියන් ද ගොයම් කැපිම සඳහා සහභාගී වූහ. එහි දී ඔවුන් විසින් ගොයම් කවි කීම එද සුලබව දක්නට තිබූ ලක්ෂණකි. එයින් ද ඔවුහු වරම් ලබා ගැනීමට මෙන්ම තම වෙහෙස නිවා ගැනීමට ද ජනකවි උපයෝගී කර ගනු ලැබූහ.

ගොවීහු ගොයම් පැගීමේ කටයුතු සඳහා ද අදට වඩා වෙනස් ක්‍රම යොද ගත්හ. ගවයින්ගෙන් පැගීම, මිනිස් ශ්‍රමය යොද පැගීම, එද දක්නට ලැබුණු ක්‍රම වේ. වර්ථමානයේ මෙන් යන්ත්‍ර උපකරණ භාවිතයක් එද දක්නට නො ලැබිණි. එද ගොයම් පැගීමේ අවස්ථාව උත්සවාකාරයෙන් කරනු ලැබීය. ගොයම් කැපීමෙන් අනතුරුව ගොයම් කමතට ඇදීමේ දී "තුන් මිටිය දැමීම" යනුවෙන් තවත් අංගයක් ඇත. මෙහි දී තුන් දෙනෙකු විසින් කොල මිටි රැගෙන තුන් වතාවක් බුදු ගුණ කියමින් කමත වටේ ගොස් කොළ මිටි තුන එකවර කමත මැදට දමනු ලබයි. මෙ මගින් ද ඔවුන් අපේක්ෂා කරනු ලැබුවේ වැඩි අස්වැන්නක් ලබා ගැනීමත් ආරක්ෂාවත් ය.

ගොයම් පැගීමට මත්තෙන් ඔවුහු විසින් කමත සකස් කළහ. කමත ආශ්‍රිත ගොඩ නැගී ඇති සංස්කෘතික අංගයන් සෑම විටම සමාජීය ස්වරූපයක් ගනු ලැබිණ. කමත වූ කලී ගොයම් පැගීම සඳහා යොද ගන්නා බිම් කැබල්ලකි. ඉන්පසු ගොවිකම් කිරීම සඳහා අවශ්‍ය දෑ කැත්ත, උකුසු ගස, කුල්ල, පෝරු ලෑල්ල ආදිය උපකරණත්. පුන් කලස් ඇතුලත් වන පරිදි මුළු කමත වැසෙන පරිදි (කවාකාරව) 07 ක් තුළ අදිනු ලබයි. එය අදිනු ලබනුයේ අළු වලිනි. මෙය අළුවන් වැඩීම යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම කවාකාර තුළ බුදුගුණ ලිවීම ද කරනු ලබයි. මෙම අළුවන් වැඩීම තුළින් ඔවුන් බලාපොරොත්තු වනුයේ ආරක්ෂාව හා ධාන්‍ය වැඩි කර ගැනීමයි. මෙය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ.

තව ද කමතේ ආරක්ෂාව සඳහා කොළ ගොඩ ගැනීමට මත්තෙන් කමත මැද කදුරු කොළ, යකඩ කැබැල්ලක්, හක් ගෙඩිය (අරක් බෙල්ලා), පොල් ගෙඩිය (අරක් මුත්තා) තබනු ලබයි. මෙ මගින් කමත ආශ්‍රිත ගොඩ නැගී ඇති විශ්වාසයක් වන කමතට අරක් ගත් බහිරවයන් හා භූතෝපද්‍රයන්ගෙන් තම අස්වනු අරක්ෂා කර ගැනීම සඳහා මෙවන්නක් සිදු කරනු ලැබීම එද දක්නට ලැබිණි. මෙහිදී ඔවුන් අරක් මුත්තා වශයෙන් තම ලද පොල් ගෙඩිය යොද ගෙන අස්වනු පාගා ලබා ගත් අළුත් වී වලින් පළමු කිරිබත සකස් කර පන්සලට දනයක් දීම සිරිතක් වශයෙන් කරනු ලැබීය.

කොල ගොඩ කිරීමෙන් අනතුරුව ගවයින්ගෙන් පැගීම බහුලව යොද ගත් ක්‍රමයකි. අද මෙන් යන්ත්‍ර උපකරණ භාවිතයක් එද දක්නට ලැබුනේ නැත. ගවයින් නොමැති අවස්ථාවක මිනිස් ශ්‍රමය යොද පැගීම කරනු ලැබීම එද දක්නට ලැබුණු ක්‍රමයකි. කමත තුළ ගවයින් ද විවිධ නම් වලින් හැඳින් වූහ, උදා:- මුදුනා, කලනා ආදී වශයෙනි. හරක් දක්වන්නා හැම විටම ගවයින්ට දැඩි ආදරයෙකින් යුක්තව හරක් දැක්වීම කරනු ලැබීය. "අඩහැරපෑම" එහි එක් අංගයකි. හරකුන්ට ඔහු ආමන්ත්‍රණය කරනු ලැබුවේ ආදරයෙන් ය. දුවා, පැටියා, අප්පුච්චි, අම්මා යනුවෙන් ගවයින්ගෙන් වන විශාල සේවය වෙනුවෙන් මෙසේ හඬගා කියනු ලබයි. මෙහිදී අඩහැර පෑම ඔවුන්ගේ දක්ෂතා විදහා පාන්නක් ද විය. වර්තමානයේ දී ද, බොහෝ ප්‍රදේශවල අවුරුදු උත්සව වල දී අඩහැර පෑම යනුවෙන් තරඟයක් ද දක්නට ඇත. එ සේම එය අද සංස්කෘතික අංගයක් බවට පත් වී ඇති ආකාරයක් දක්නට ලැබේ.

කොල පැගීමේ ද අවස්ථා කිපයක් දැකිය හැක. එනම් වට කැඩීම, ඉන්පසු මැඩුවන් හලා බෑම යන අවස්ථායි. මැඩුවන් ඇදීම ද බුදුගුණ ගායනා කරන අවස්ථාවකි. එහිදී තුන් දෙනෙකු විසින් තම උකුසු ගස් වලින් කොල මිටිය මිටිය ගෙන බුදුගුණ මතුරමින් කමත වටේ රවුම් කිහිපයක් ගොස් බැත රැකීම සඳහා සකසා ගත් පැලට හා තවත් ස්ථාන දෙකකට කොල දමනු ලබයි. මෙ මගින් ද හොඳ අස්වැන්නක් ඔවුන් අපේක්ෂා කරනු ලබයි.

ගොයම් පැගීමෙන් පසු අවස්ථාවේ එනම් වී සකස් කර ගන්නා අවස්ථාව හා සම්බන්ධව ද චාරිත්‍ර ගොඩ නැගී තිබේ. සෑම විටම වී පෙලීම කරනු ලැබුවේ මිනිස් ශ්‍රමය යොද ගැනීමෙනි. කුණුරොඩු ඉවත් කළ පසු වී කන්දක් ආකාරයෙන් ගොඩ ගසනු ලබයි. එම අවස්ථාවේ වී හඳුන්වනු ලබන්නේ බැත යනුවෙනි. වී පෙලීමට මත්තෙන් බැත කන්ද වටේට පිදුරු වලින් ලනුවක් දමනු ලබයි. එම ලනුව වෙනිය යනුවෙන් නම් කරයි. මෙම වෙනිය බැත පෙලීමෙන් පසු ඔතා කුඹුර අසල තබනු ලබයි. එයින් ඔවුන් බලාපොරොත්තු වන්නේ කුඹුරේ ආරක්ෂාවයි.

වී පෙලීමට මත්තෙන් කුල්ලට වී එකතු කරනු ලබන්නේ නමස්කාරය කිරීමෙන් අනතුරුවයි. එසේ ලබා ගත් වී අව සඳක ආකරයෙන් මෙම බැත කන්ද වටා දමනු ලබයි. ඉන්පසු දෙදෙනෙකු හෝ හතර දෙනෙකු එසේ එක්තරා රටාවකට අනුව බැත පෙලීම කරනු ලබයි. මෙහිදී ද අනුගමනය කරන පිලිවෙත් මාලාවක් ඇත. කුලු මාරු කිරීම හැම විටම සිදු වූයේ පිටුපසිනි. එසේම මෙම අවසඳක ආකාරයෙන් ඇති බැත හරහා යම් පුද්ගලයෙකු පැන්නහොත් ලාස් 7 ක් නැවිය යුතු ය.නැත්නම් ඔහුට උපද්‍රවයක් සිදු විය හැකි බවට ද විශ්වාසයක් ඔවුන් තුල ඇත. මෙලෙස ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් සංස්කෘතික අංගයන්ගෙන් යුක්ත වූ ක්‍රියා පරිපාටියක් බොහෝ ප්‍රදේශ වල දැනුදු දැකිය හැකිය.

බීජ නිසි පරිදි සකස් කිරීමේදී ඔවුන් අනුගමනය කලේ වඩාත් යෝග්‍ය පරිදි වී ඇට වලට හානියක් නොවන ක්‍රියාදමයකි. එය ද ප්‍රදේශයට වෙනස් ස්වරූපයක් ගනු ලැබීය. බොහෝ ප්‍රදේශවල අනුගමනය කළ ක්‍රමය වූයේ කපා ගත් ගොයම් කමතට රැගෙන ගොස් ගොඩ ගසන විට එමගින් බිම හැලෙන වී ඒ සඳහා යොද ගැනීමයි. ඒවා නිසි විටෙකත් හානියට නොපැමිණි බීජ හෙයින් එම වී ඒ සඳහා යොද ගන්නා ලදී. ගවයින් ගෙන් පැගීම කළ ද වී ඇටවලට වන හානිය ට්‍රැක්ටර් වලින් වන හානියට වඩා අඩුය. කෙසේ වුවද වී පෙලීමෙන් අනතුරුව ඔවුන් තම බීජ අවශ්‍යතා සඳහා කොටසක් වෙන් කිරීම හා එම කන්නය සඳහා ලබා ගත් බිත්තර වී නැවත දීමට එම අවස්ථාවේදීම වෙන් කරනු ලැබීම දැකිය හැකි ය.

නෙලා ගත් අස්වැන්න ගබඩා කිරිම ද ආරක්ෂිත ක්‍රමයකට සකස් කර තිබිණි. "බිස්ස" යනුවෙන් හඳුන්වන ගබඩාව බොහෝ විට ඒ සඳහා යොද ගන්නා ලද ක්‍රමයයි. ඒ සඳහා විශාල වියදමක් දැරීමට අවශ්‍ය නොවේ. කෘෂි විද්‍යාඥයින්ගේ අදහසට අනුව එය වඩාත් යෝග්‍ය ක්‍රමයකි. වී වල තෙතමනය ආරක්ෂා වන පරිදි මනාව එය සකස් කර ඇත. බිස්ස තුලින් හෙළි වන සමාජීය ස්වරූපයක්ද ඇත. තමාගේ වත්කම් ප්‍රදර්ශනය කරන එක් අංගයක් ලෙස එය යොද ගන ලැබීය. තම නිවස ඉදිරිපිට සකස් කර ගත් බිස්ස පවුලේ ආර්ථික තත්ත්වය විදහා පෑවේ ය. ඒ අනුව විවාහ ගිවිසුම්වල දී එක් පාර්ශවයක් අනෙක් පාර්ශ්වයට තම වත්කම් හෙළි කිරීමේ දී වී බිස්ස වැදගත් තැනක් ගනු ලැබීය.